## සංඥාපනය. PREFACE.

ප්‍රශස්ත පුරාණ ක්‍රමයට අනුව බාලයන්ට සිංහල අක්ෂර ශික්ෂාව කරවන්නවුන් විසින් පළමුකොට සංස්කෘත සෝඩිය කියවනු ලැබේ. ඒ මනා ක්‍රමය මෙකල බොහෝසේ අභාවයට පැමිණනිබෙන හෙයිනුත් ඊට අන්තර්ගත පොත් පඩක්තිය මනාව ප්‍රගුණකර ගැණිම සීමෙන් බිණීමෙහි දක්ෂභාවය හික්මීම සදාචාරය පණ්ඩිතභාවය යනාමේ ගුණාඞ්ග ලැබීමට අත්‍යන්තෝපකාරීහෙයිනුත් මේ සෝඩිය මුල්කොට ඇති ඒ පොත් පඩ්කතිය **සිංහළ ග්‍රන්ථාණිවය** නමැති මේ ග්‍රන්ථ ප්‍රසිඞියේ මුලටම යෙදීමට නියමකරගන්නාලදී.

**සෝඩි යන ශබ්දය සමාන අර්ථඇති චුවඩි යන දෙමළ වචනයෙන් සින්නාවූ බැව් පෙණේ. පාළි සංස්කෘත භාෂාවල අක්ඛරමාලා, වණ්ණමාලා, අක්ෂර මාලා, වර්ණමාලා, යනාදි වචන ඇති නමුත් සෝඩි යන්නට ආසන්න වචනයක් නැත්තේය. එහෙත් මේ පදයේ උත්පත්තිය මූලක්ඛරවිකාසිනී නම්වූ සෝඩිසත්තයේ මෙසේ දක්වාතිබේ :—**

"අබ්භාදෘ නනනව්ත්ථුසු සුචිඨුඩේති පවත්තති
අ ආදෘක්ඛරමාලාති තස්මා සෝඩීති වුච්චති.

**"අ ආදෘක්ඛරමාලා, අකාරාදිවූ අක්ෂරමාලාතොමෝ; ති (යස්මා), යම් කාරණයකින්; අබ්භාදි, අකාශාදියෙහි හෙවත් ආකාශාදිගතවූ; අනනතවත්ථුසු, අනනත වස්තූයෙහි; සුචිඨුඩේති, මොනවට හැසිරේද; (සුචිඨු) පවත්තති, (ආකාශභූමිගත අනනතාභිධානයෙහි මොනවට) පවතීද; තස්මා, ඒ කාරණයෙන්; සෝඩිති, සෝඩීයයි; වුච්චති, කියනුලැබේ.**

**"අනන්තාභිධානවෝ" යනු හෙයින් ආකාශගමනාපීයද, භූමිගත ප්‍රවෘත්ති අර්ථයද, ඩී යන ධාතුනුගේම, අර්ථ විශේෂයයි දතයුතු."**

**සෝඩියේ මුලට හා අගටත් යොදාතිබෙන ආශීර්වාද වාක්‍ය දෙකේ අභිප්‍රාය මෙසේය :—සවස්තිසිඞම්—(මට) සුවයෙක් වේවා; ඉති සිඞිරස්තු—මෙසේ (මාවිසින් කටයුතු ශාස්ත්‍රයාගේ) සංසිඞිය වේවා.**

සෝඩිය කියන ආකාර මෙසේය :—

**සවස්තිසිඞම්**........**අ**යනු **ආ**යනු—**ඉ**යනු **ඊ**යනු—**උ**යනු **ඌ**යනු—**ඍ** (ඉරු) යනු **ඎ** (ඉරූ) යනු—**ඏ** (ඉලු) යනු **ඐ** (ඉලූ) × යනු—**එ*** යනු **ඓ** යනු—**ඔ** යනු **ඖ** යනු—**අං** † **අඃ**........

**ක**යනෝක් **ඛ**යනු—**ග**යනෝග් **ඝ**යනු—**ඞ**යනු—**ච**යනෝච් **ඡ**යනු—**ජ**යනෝජ් **ඣ**යනු—**ඤ**යනු—**ට**යනෝට් **ඨ**යනු—**ඩ**යනෝඩ් **ඪ**යනු—**ණ**යනු—**ත**යනෝත් **ථ**යනු—**ද**යනෝද් **ධ**යනු—**න**යනු—**ප**යනෝප් **ඵ**යනු—**බ**යනෝබ් **භ**යනු—**ම**යනු—**ය**යනු—**ර**යනු—**ල**යනු—**ව**යනු—**ශ**යනු—**ෂ**යනු—**ස**යනු—**හ**යනු—**ළ**යනු ‡ ........ඉති සිඞිරස්තු........

**ක**යනු **කා**යනු—**කි**යනු **කී**යනු—**කු**යනු **කූ**යනු—**කෘ** (කුරු) යනු **කෲ** (කුරූ) යනු—**කෟ** (කුලු) යනු **කෳ** (කුලූ) යනු—**කෙ*** යනු **කෛ** යනු—**කො** යනු **කෞ** යනු—**කං කඃ**. (මෙසේම ළයන්න දක්වා ඉතුරු අක්ෂරද කියවත්.)

මීටපසුව පිල්ලම් කියවත්. ඒ මෙසේය :—

කයන්න බැඳි **ඛ**යන්නේ—කයන්න බැඳි **කි**යන්නේ—ඉස්පිල්ලෙ ලියාලුවෙන් **කී**යන්නේ—සංයෝග§ මහාප්‍රාණ **ඛ**යන්නේ—අල්මයන්නේ‖ ........

අයන්නේ-ඇලපිල්ල ලියාලුවෙන් **ආ**යන්නේ-**ඉ**යන්නේ—බින්දු දෙක ලියාලුවෙන් **ඊ**යන්නේ-**උ**යන්නේ—ගයනු ඉත්ත ¶ ලියාලුවෙන් **ඌ**යන්නේ—ඇලපිල්ල ලියාලා ගැටේ ලියාලුවෙන් **ඍ** (ඉරු) යන්නේ—ඇලපිළි දෙක ලියාලා ගැටදෙක ලුවෙන් **ඎ** (ඉරූ) යන්නේ—ගයනු ඉත්ත ලියාලුවෙන් **ඏ** යන්නේ—ගයනු ඉත්ත ලියාලා ගැටේ ලියාලුවෙන් **ඐ** ** —**එ**යන්නේ-කොම්බුව ලියාලු

---

× ඍ, ඎ, ඏ, ඐ, යනු පිළිවෙළින් රි, රී, ළි, ළී, අකාර උතුරු ඉන්දියාවේ ශබ්දකරණු ලැබේත්. මෙරට පවතින විධිය දකුණු ඉන්දියාවේ ශබ්දකරණ විධියට සමානය.

* ඒනු කෝනුද කියත්. එ ඔ කීවේදී ඒ යනු ඕ යනු කියය යුතුබැව් පෙණේ.

† ආම් යි බොහෝසේ කියත්. මෙය අම් දීර්ඝකොට චරද්ධා කීමකි. අං යනු ඉන්දියාවේ (විශේෂයෙන් දකුණු ඉන්දියාවේ) අම් කියා ශබ්දකරණු ලැබේ.

‡ අං ඉති සිඞිරස්තු සිඞ බොහෝසේ කියත්. මෙහි ඇ යන්නක් උවමනා නැතිබැව් පෙණේ.

§ සඤ්ඤක සිද බොහෝසේ කියත්.

‖ අල්දුම්මයන්නෙ සිද කියත්.

¶ ගයනුකිත්ත සිද කියත්.

** ඏ ඐ කියා සෝඩියේ යොදනලද අකුරු දෙක ඏ ඐ කියා යෙදිය යුතුබැව් මෙයින් හැඟේ. මේවා පළමු දක්වූලෙස මෙකල බොහෝදෙනා යොදාත් දෙවනුව කී ක්‍රමය වඩා යෝග්‍යසේ පෙණේ.

ලුවෙන් ඓ යන්නේ—ඔ යන්නේ— ගයනුඉත්ත ලියාලුවෙන් ඖ යන්නේ—අං යන්නේ—අල්මය න්නේ-බින්දු දෙකලියාලුවෙන් අඃ කියන්නේ.

අල්ප කයන්නේ—මහාප්‍රාණ ඛයන්නේ—අල්ප ගයන්නේ—මහාප්‍රාණ ඝයන්නේ—ඞයන්නේ-අල්ප චයන්නේ—මහාප්‍රාණ ඡයන්නේ—අල්ප ජ යන්නේ—මහාප්‍රාණ ඣයන්නේ —ඤයන්නේ—අල්ප ට යන්නේ— මහාප්‍රාණ ඨයන්නේ— අල්ප ඩයන්නේ—මහාප්‍රාණ ඪයන්නේ—මූර්ධජ ණයන් නේ—අල්ප තයන්නේ—මහාප්‍රාණ ථයන්නේ—අල්ප දයන්නේ—මහාප්‍රාණ ධයන්නේ—දන්තජ නයන්නේ—අල්ප පයන්නේ—මහාප්‍රාණ ඵයන් නේ—අල්ප බයන්නේ—මහාප්‍රාණ භයන්නේ—මයන්නේ— යයන්නේ-රයන්නේ— ලයන්නේ-වයන්නේ-කඩ ශයන්නේ-ගොළු ෂයන්නේ-මහ සයන්නේ-හයන්නේ-සංයෝග ළයන්නේ*........

ඉයන්නේ—ඉස්පිල්ල ලියාලුවෙන් කියන්නේ-ඉස්පිල්ලේ ලියාලුවෙන් ඝියන්නේ—සංයෝග මහා ප්‍රාණ ඛි යන්නේ— ර යන්නේ—ස යන්න බැඳි ක්‍ෂයන්නේ........

කයන්නේ— ඇලපිල්ල ලියාලුවෙන් කායන් නේ—ඉස්පිල්ල ලියාලුවෙන් කියන්නේ—ඉස්පිල් ල ලියාලා ගැටේලියාලුවෙන් කීයන්නේ-පාපිල්ල ලියාලුවෙන් කුයන්නේ—පාපිල්ල ලියාලා පෙක ණිය† ලියාලුවෙන් කූයන්නේ—ඇලපිල්ලත් ගැටෙත් ලියාලුවෙන් කෘ යන්නේ-ඇලපිලි දෙකත් ගැටදෙකත් ලියාලුවෙන් කෲ යන්නේ-ගයනුඉත් ත ලියාලුවෙන් කෟ යන්නේ—ගයනුඉත්තත් ගැටෙත් ලියාලුවෙන් කෳ යන්නේ-කොම්බුව ලියාලු වෙන් කෙයන්නේ—කොම්බු දෙක ලියාලුවෙන් කෛයන්නේ—කොම්බුවත් ඇලපිල්ලත් ලියාලු වෙන් කොයන්නේ—කොම්බුවත් ගයනුඉත්තත් ලියාලුවෙන් කෞයන්නේ—බින්දුව ලියාලුවෙන් කංයියන්නේ—බින්දු දෙකලියාලුවෙන් කඃ කිය න්නේ........(ළයන්නදක්වා ඉතුරු සියලු අක්ෂරද මෙසේකියත්.)

මෙහි පහත දක්වන ආකාරද පිල්ලම් කියත්:—

ස්වස්ති කී සයන්නලා වයන්න බැඳලියාලුවෙන් මේ සයන්නේ මේ වයන්නේ-ස්වස්ති කී සයන්න ලා තියන්න බැඳ ලියාලුවෙන් මේ සයන්නේ මේ ති යන්නේ—ඉස්පිල්ල ලියාලුවෙන් ති යන්නේ-සිඩම් කී ඉස්පිල්ල ලියාලුවෙන් සියන්නේ-සංයෝග මහාප්‍රාණ ඛයන්නේ-සංයෝග ලියාලුවෙන් සංයෝග මහාප්‍රාණ ඛයන්නේ—සිඩම් කී අල්දුම්මය න්නේ—අල්ලියාලුවෙන් අල්දුම්මයන්නේ........

අයනු කී අයන්නේ-ආයනුකී ආයන්නේ-ඇල පිල්ල ලියාලුවෙන් ආයන්නේ—ඉයනු කී ඉයන් නේ-ඊයනු කී ඊයන්නේ-දෑලේ බින්දුදෙක ලියා ලුවෙන් ඊයන්නේ—උයනුකී උයන්නේ—ඌයනු කී ඌයන්නේ-ගයනුඉත්ත ලියාලුවෙන් ඌයන් නේ—ඍයනුකී ඍයන්නේ—ඇලපිල්ල ලියාලා ගැටේ ලියාලුවෙන් ඍයන්නේ-ඎයනුකී ඎයන් නේ—ඇලපිළි දෙකලියාලා ගැටදෙක ලියාලුවෙ න් ඎයන්නේ—ඏයනු කී ඏයන්නේ—ගයනු ඉත්ත ලියාලුවෙන් ඏයන්නේ—ඐයනුකී ඐ යන්නේ—ගයනුඉත්ත ලියාලා ගැටේලියාලුවෙන් ඐයන්නේ—එයනුකී එයන්නේ—ඓයනුකී ඓ යන්නේ—කොම්බුව ලියාලුවෙන් ඓයන්නේ— ඔයනුකී ඔයන්නේ-ඖයනුකී ඖයන්නේ-ගයනු ඉත්ත ලියාලුවෙන් ඖයන්නේ—ආම්කී ආයන් නේ-ඇලපිල්ල ලියාලුවෙන් ආයන්නේ—ආම් කී අල්දුම්මයන්නේ— අල්ලියාලුවෙන් අල්දුම්මයන් නේ—ආම් අඃ කී අඃ කියන්නේ—බින්දුදෙක ලියා ලුවෙන් අඃ කියන්නේ.

කයනුකී අල්ප කයන්නේ-ඛයනෝක් ඛයනුකී මහාප්‍රාණ ඛයන්නේ—ගයනුකී අල්ප ගයන්නේ- ඝයනෝග් ඝයනුකී මහාප්‍රාණ ඝයන්නේ-ඞයනුකී ඞයන්නේ ‡‡—(ච ඡ ජ ඣ ට ඨ ඩ ඪ ත ථ ද ධ ප ඵ බ භ යන අකුරු කීමද මේ ක්‍රමයෙනි.)

ඤයනු කී ඤයන්නේ §§—ණයනුකී මූර්ධජ ණය න්නේ—නයකී දන්තජනයන්නේ—මයනුකී ම යන්නේ— යයනුකී යයන්නේ—රයනුකී රයන් නේ—ලයනුකී ලයන්නේ—වයනුකී වයන්නේ— ශයනු කී කඩශයන්නේ—ෂයනුකී ගොළු ෂයන් නේ—සයනුකී මහ සයන්නේ- හයනුකී හයන් නේ—ළයනුකී සංයෝගළයන්නේ.

ඉ කී ඉයන්නේ-ති කී තියන්නේ—ඉස්පිල්ලලි යාලුවෙන් තියන්නේ-සිඩි කී සියන්නේ-ඉස්පිල්

* පුල්ලගම බිඳ ව ලියාලුවෙන් අං යිනක්නෙ සිද කියත්. ඉහත 5 වෙනි පිටේ † අවෝලිපිය බලනු.
† පෙක ණිය. වෙනුවට ගැටෙවිද්ද කියත්.

‡‡ ඞ යනු කී කණ්ඨජ ඞංසේනම් මැනවි.
§§ ඤ යනු කී තාලුජ ඤයන්නේනම් මැනවි.

ල ලියාලුවෙන් සියන්නේ-සිඛි කී සංයෝග මහාප්‍රාණ ඛියන්නේ-සංයෝග ලියාලුවෙන් සංයෝග මහාප්‍රාණ ඛයන්නේ-රකනු කී රයන්නේ-ෂයන්තලා තුගෙන්නබැඳ ලියාලුවෙන් මේ ෂයන්නේ මේ තුයන්නේ-පාපිල්ල ලියාලුවෙන් තුයන්නේ......

කයනුකී කයන්නේ—කායනුකී කායන්නේ—ඇලපිල්ල ලියාලුවෙන් කායන්නේ—කියනුකී කියන්නේ—ඉස්පිල්ල ලියාලුවෙන් කියන්නේ—කීයනුකී කීයන්නේ—ඉස්පිල්ල ලියාලා ගැටේ ලියාලුවෙන් කීයන්නේ—කුයනුකී කුයන්නේ—පාපිල්ල ලියාලුවෙන් කුයන්නේ—කූයනුකී කූයන්නේ—පාපිල්ල ලියාලා පෙකණිය ලියාලුවෙන් කූයන්නේ—කෘයනුකී කෘයන්නේ—ඇලපිල්ල ලියාලා ගැටේ ලියාලුවෙන් කෘයන්නේ—කෲයනුකී කෲයන්නේ—ඇලපිලිදෙක ලියාලා ගැටදෙක ලියාලුවෙන් කෲයන්නේ—කෟයනුකී කෟයන්නේ—ගයනුඉත්ති ලියාලුවෙන් කෟයන්නේ—කෳයනුකී කෳයන්නේ—ගයනුඉත්ත ලියාලා ගැටේ ලියාලුවෙන් කෳයන්නේ—කෙයනුකී කෙයන්නේ—කොම්බුව ලියාලුවෙන් කෙයන්නේ—කෛයනුකී කෛයන්නේ—කොම්බුදෙක ලියාලුවෙන් කෛයන්නේ—කොයනුකී කොයන්නේ—කොම්බුවත් ඇලපිල්ලත් ලියාලුවෙන් කොයන්නේ—කෞයනුකී කෞයන්නේ—කොම්බුවත් ගයනුකිත්තත් ලියාලුවෙන් කෞයන්නේ—කාම් කී කායන්නේ—ඇලපිල්ල ලියාලුවෙන් කායන්නේ—කාම් කී අල්දුම්මයන්නේ—අල් ලියාලුවෙන් අල්දුම්මයන්නේ—කාම් කඃ කී කඃකියන්නේ—බින්දුදෙක ලියාලුවෙන් කඃකියන්නේය......(ඉකුරු අකුරු පිළිබඳ පිල්ලම්කීම ද මේ ක්‍රමයෙණි.)

වැල්ලේ ලීමේදී කියමන්න පිල්ලම් කියන ක්‍රමය මේ.

මේ සෝඩිය වෙණස් අකුරු 50 න් යුක්තයි. ඉන් අකාරයේ සිට ඖයන්න දක්වා ඇති 14 ර පණකුරු හෙවත් ප්‍රාණාක්ෂරනම් වෙත්; කයන්නේසිට ළකාරය අවසන්කොට ඇති 34 ර ද අනුස්වාර නම්වූ ං (බින්දුව) ද විසර්ග නම්වූ ඃ (බින්දුදෙක) ද යන 36 ගතකුරු හෙවත් ගාත්‍රාක්ෂර වෙත්, ගාත්‍රාක්ෂරවූ අනුස්වාරය හා විසර්ගයත් අ කාරයසහිතකොට ප්‍රාණාක්ෂර පෙළෙහි තබනලද්දේ ඒවා නිතර ප්‍රාණාක්ෂරයකට පසුව යෙදෙන නිසාත් අන්‍ය ගාත්‍රාක්ෂරමෙන් කිසිවිටක ප්‍රාණාක්ෂරයක් රහිතව නොයෙදෙන නිසාත්යයි හැඟේ. මේ යෙදීම ඉන්දියාවේ (විශේෂයෙන් දකුණු ඉන්දියාවේ) පවතින ක්‍රමයට අනුව කරණලදී. ගතකුරු පෙළේ සියල්ල අල්ලකුණුවලින් යුක්තවිය යුතුනමුත් ඒ ලකුණු නැතිව අ සහිතකොට ක ග ආදි වශයෙන් දක්වනලද්දේ ශබ්දකිරීමේ පහසුව පිණිස වේ. පණකුරු පෙළේ අකුරු ගතකුරු සමගතිබෙන අක්ෂර හා ගාලපීමෙන් ක කා කි කී ආදිය සෑදෙත්. ඒ මෙසේය :—

ක් සහ අ—ක. ක් සහ ආ—කා. ක් සහ ඉ—කි. ක් සහ ඊ—කී. ක් සහ උ—කු. ක් සහ ඌ—කූ. ක් සහ ඍ—කෘ. ක් සහ ඎ—කෲ. ක් සහ ඏ—කෟ. ක් සහ ඐ—කෳ. ක් සහ එ—කෙ. ක් සහ ඓ—කෛ. ක් සහ ඔ—කො. ක් සහ ඖ—කෞ. ක් සහ අං—කං. ක් සහ අඃ—කඃ.

සිංහළ බැඳිඅකුරු හා ලකුණු ස්වල්පයක්ද මෙහි පහත දක්වනු ලැබෙත්:

| | | | | | |
|---|---|---|---|---|---|
| ක්‍ව | — | ක්ව | ඤ්‍ච | — | ඤ්ච |
| ග්‍ධ | — | ග්ධ | ඤ්‍ජ | — | ඤ්ජ |
| ක්‍ෂ | — | ක්ෂ | ට්‍ඨ | — | ට්ඨ |
| ත්‍ථ | — | ත්ථ | ණ්‍ඩ | — | ණ්ඩ |
| න්‍ථ | — | න්ථ | ද්‍ධ | — | ද්ධ |
| න්‍ද | — | න්ද | ද්‍ව | — | ද්ව |
| න්‍ධ | — | න්ධ | ඳ | — | න්ද |
| න්‍ව | — | න්ව | ඹ | — | ම්බ |
| ච්‍ච | — | ච්ච | ෘ (හ්‍රස්ව මාත්‍රාංශය) | — | ඍ |
| බ්‍බ | — | බ්බ | ෲ (දීර්ඝ මාත්‍රාංශය) | — | ඎ |
| ජ්‍ඤ | — | ජ්ඤ | ර්‍ (රේඵය) | — | ර් |
| ඞ්‍ග | — | ඞ්ග | ්‍ර (උත්තර රකාරාංශය) | — | ර |
| | | | ්‍ය (යංශය) | — | ය |

මේ සංස්කෘත සෝඩියට අභිනව සංස්කෘත සෝඩියෙහි නැති මූර්ධන්‍ය ළකාරය ඇතුලත්වී තිබේ. මූර්ධන්‍ය ළකාරය වේදය ලිවූ කාලයේ සංස්කෘත භාෂාවේ පැවති අකුරකි. එය ඩ ස වෙනුවට ඇතම් විට යොදනලදී. පසු කාලයෙහි එය අභාවයට පැමිණිකල දන්ත්‍ය ලකාරයම ඒ වෙනුවට භාවිතා කිරීමට පටන්ගන්නාලදී. ඒ මූර්ධන්‍ය ළකාරය මේ සංස්කෘත සෝඩියට අන්තර්ගත කරණලද්දේ සිංහල භාෂාවේ ඒ ළකාරශබ්දය ඇඟවීමට වෙන් අක්ෂරයක් තිබුන හෙයිනැයි හැඟේ. එසේහෙයින් සංස්කෘත වචන සිංහල අකුරෙන් ලියනකල ඒවායේ ලකාර පරීක්ෂාකොට ලකාර ළකාර තිසියාකාර යෙදියයුතුබැව් පෙණේ. ඒ පරීක්ෂාවට පාළිවචනවල ලකාර ළකාර යෙදීම සැලකීමද ඉවහල්වේ. මෙසේ පරීක්ෂාකල කල ඒළකා නම් ඒලක ශබ්දයද ගුළියට නම්වූ ගෝලශබ්දයද නැළියට නම්වූ නාලිශබ්දය ආදි වචන මූර්ධන්‍ය ලකාරයෙන් (පාළියෙහි මෙන්) ඒළක, ගෝළ, නාළි කියා ලියයුතුබැව් හැඟේ,

මම සංස්කෘත සෝඩියට පාළි සෝඩියේ සියලුම අකුරු අන්තර්ගතවීතිබෙත්. පාළි සෝඩිය මෙසේය:-

අ ආ ඉ ඊ උ ඌ එ ඔ
ක ඛ ග ඝ ඞ ච ඡ ජ ඣ ඤ ට ඨ ඩ ඪ ණ ත ථ
ද ධ න ප ඵ බ භ ම ය ර ල ව ස හ ළ ං.

එහෙත් ශුඩ සිංහල සෝඩියේ ඇත්තාවූ ඇ ඈ එ ඔ (ග ඩ ද බ යන අකුරු හා සංයෝගවෙන) සඤ්ඤක හෙවත් අඩිඅනුස්වාරයද එහි නොවෙත්. එළු සෝඩිය මෙසේය :—

අ ආ ඇ ඈ ඉ ඊ උ ඌ එ ඒ ඔ ඕ
ක ග ච ජ ඤ ට ඩ ණ ත ද න ප බ ම ය ර
ල ව ස හ ළ ං.

මෙකී අමුතු අක්ෂරවූ ඇ ඈ සහ හ්‍රස්ව එ ඔ ද සංස්කෘත සෝඩියේ අකුරුවලට එකතුකලකල මිශ්‍ර සිංහල භාෂාව ලිවීමට උවමනා සෝඩියේ අක්ෂර ලැබෙත්. මේ මිශ්‍ර සිංහල සෝඩිය මෙසේය :—

අ ආ ඇ ඈ ඉ ඊ උ ඌ ඍ ඎ ඏ ඐ එ
ඒ ඓ ඔ ඕ ඖ

ක ඛ ග ඝ ඞ ච ඡ ජ ඣ ඤ ට ඨ ඩ ඪ ණ ත ථ ද
ධ න ප ඵ බ භ ම ය ර ල ව ශ ෂ ස හ ළ ං ඃ.

පාළි සංස්කෘත ආදි භාෂාවල වචන මිශ්‍රව සෑදුනාවූ සිංහල මිශ්‍ර භාෂාව ලියන කල මේ සෝඩියම භාවිතාකිරීම යුතු නමුත් ඒ ඒ භාෂාවේ වචන ඒ ඒ සෝඩියට අයිති අකුරුවලින් ලිවීම පුරුදුවීතිබේ.

ඉංග්‍රීසි F අක්ෂරයේ ශබ්දය ඇඟවීමට ෆ් යන ලකුණ මෙකල භාවිතාකරණුලැබේ. මේ ලකුණ සමාන ශබ්දඇති උපද්මානීනම් සංස්කෘත අක්ෂරයේ අඩියකි. එහි රූපාකාරයද සිංහල අක්ෂරවලට යෝග්‍යවේ. එබැවින් මේ ලකුණ ඉංග්‍රීසි F ශබ්දය කීමට අතිශයෙන් යෝග්‍යවේ එය ප්‍රාණාක්ෂර සහිතවූකල මෙසේ යෙදේ :

ෆ ෆා ෆැ ෆෑ ෆි ෆී ෆු ෆූ ෆෘ ෆෲ ෆෟ ෆෳ ෆෙ
ෆේ ෆෛ ෆො ෆෝ ෆෞ ෆං ෆඃ.

දැනට ව්‍යවහාරවෙන සිංහල අකුරු දක්ෂිණ අශෝක අක්ෂරවලින් උපන් ග්‍රන්ථාක්ෂර වලින් සෑදුනබැව් පෙණේ. ඒවා මෙරට සොළී අණ්ඩුව පැවති කාලයේදී (ක්‍රි. ව. 1038—1050) හෝ ඊට ස්වල්පකාලයකට පූර්වයෙහි හෝ භාවිතාකරණට පටන්ගන්නාලදැයි සිතිය හැකිය. ඊටපෙර මෙරට භාවිතාකරණලද අකුරු අශෝක අක්ෂරවූහ. දැනට ඉන්දියාවේ පවතින අකුරුවලී අතුරෙන් ග්‍රන්ථාක්ෂර විශේෂයක්වූ තුළුව අක්ෂර සිංහල අක්ෂරවලට ඉතාම ආසන්නය.


පුරාණකාලයෙහි සිට ගොළුවත් බිහිරන් අතර හස්තමුද්‍රාමය සෝඩියක් මෙරට පැවතුනේය. ඒ සෝඩිය මෙහිපහත පෙණෙන පුරාණ කවිවලින් ප්‍රකාශවේ:—

1 (අ) යනු නලල මැද, (ඉ) යනු බැමය දනු, (උ) යනු ඇසට, නාසෙට (ඒ) ය නු
(ඔ) යනුද සවණත, (ක) යනු මූකය දනු, (ග) යනු නිකට, බෙල්ලට (ච) ය නු
(ජ) යනුද උරපිට, (ඤ) යනු අතමුල, (ට) යනු කිහිළි, වැලමිට (ඩ) ය නු
(ණ) යනු අල්ල, පිටිඅල්ලට (ද) යනුද, (න) යනු ලැමද, තනපිට (ප) ය නු

2 (බ) යනුද බඩමැද, (ම) යනු උකුල දනු, (ය) යනු කලව, දනඉස (ර) ය නු
(ල) යනු කෙණ්ඩ වනු, (ව) යනු වලලුකර, (ස) යනුට විලුඹුල් නියම ව නු
(හ) යනු පතුල දනු නැණයෙන් විමසා ඇල්ලූ තැනින් තැන බලා ග නු
කී යනු මෙසේ මේ ශාස්ත්‍රය මුල්කර නැණයෙන් විමසා තෝර ග නු

3 ඉසට උඩින් අතගතිනම් කොම්බුව, ඉසඇල්වීනම් ඉස්පි ල් ලා
ඇලපිට ඇලපිළි, නියතොතු අල් විය, යටිපතුලට ගණු පාපි ල් ලා
ඉසකේ ඇද ලිවීමට ගත් වියුතුනි නැණයෙන් විපරම් කරග ල් ලා
හස්තමුද්‍ද යන බාසා අකුරකි මුවෙන් නොකිය කිය අතින ල් ලා

මෙහි 'විලුඹුල්' යන්නෙන් විලුඹ කෙළවරද 'ඇදලිවම්' යන්නෙන් 'ඇදය'යි කියන ෑ ෑ යන මාත්‍රාංශ ලකුණුද කියනලද්දූහ; නියපොතු ඇල්ලීමෙන් අකුරේ අල් සවභාව ප්‍රකාශවේ, එසේකිරීමෙන් දීඝී ප්‍රාණාක්‍ෂරද කියයුතුය. මෙහි මහා ප්‍රාණාක්‍ෂර සහ ඩ, ණ, ං ශ, ෂ, යන අක්‍ෂරද ඇඟවීමට ලකුණු නොදක්වන ලද්දේ මහා ප්‍රාණාක්‍ෂර වෙනුවට අල්ප ප්‍රාණාක්‍ෂරද, ඩ, ණ, ං වෙනුවට දන්තජ නකාරයද, ශ, ෂ වෙනුවට සකාරයද යෙදීම අදහස් සෑහෙණතරම් ඇඟවීමට ප්‍රමාණනිසා වියයුතුය. මේ ක්‍රමය ඉදිගෙණ භාවිතාකරණ කෙනෙකුට වැඩි අඵාසුවක් නොවේ. මෙය ඇත සිටින්නන් සමග කථාකිරීමටද යමෙකුට පිරිස් මධ්‍යයේ යම් රහස් අදහසක් ඇඟවීමටද ප්‍රයෝජනවති, සෙල්ලම් පිණිස භාවිතාකිරීමටද සෑහේ.




## සිංහල ඉලක්කම්.

ප්‍රතිකාල් ලංසි ඉංග්‍රීසි යන ආණ්ඩු තුණ විසින්ද අණපණත් අන්තගීත පොත් ආදියේ පවා භාවිතාකරණලද මේ ඉලක්කම් ක්‍රි. ව. 1824 දී පමණ හැරදමා ඒ වෙනුවට දැන් ව්‍යවහාරකරණ අරාබි ඉලක්කම්ම යෙදීම පටන්ගන්නාලදී. ප්‍රතිකාල් සහ ලංසිආණ්ඩු පැවති මුද්‍රකර පලාත්වල මේ අරාබි ඉලක්කම් භාවිතාව පළමුවෙන් ක්‍රි. ව. 1505 දී පමණ පටන්ගන්නාලදුව ක්‍රමයෙන් මුළු ලඞකාවේම පැතිර ගියේය. සම්පූර්ණයෙන් විනාශවීයාම වලකනු පිණිසත් පුරාණ ලියවිලි කියවා තේරුම්ගැණීමට ආධාරවනු පිණිසත් දීඝීකාලයක් ප්‍රකටව තිබුන ඒ සිංහල ඉලක්කම් (සමාන අරාබිඅඞක සමග) මෙහි පහත දක්වනු ලැබෙත් :–

මේ ඉලක්කම්වල යෙදීම අරාබි ඉලක්කම් යොදන පිළිවෙළට වේ. ශුන්‍යය ඇඟවීමට උවමනාකල්හි බින්දුවද යෙදිය හැකිය.

## අන්‍යවූ සංඛ්‍යා ක්‍රම.

ගණන් ඇඟවීමට ඉහත දක්වනලදක්‍රමය හැර තවත් ක්‍රම මෙරට ඇත්තාහ. පුස්කොළ පොත්හි කොළගණන් දක්වීමට යථෝක්ත සංසකෘත සෝඩියේ ගතකුරු යොදති. ක, කා, කි, කී, කු, කූ, කෘ, කෲ, කෟ, කෳ, කෙ, කෛ, කො, කෞ, කං, කඃ, ආදි මෙනි. මෙසේ එක එකූ ගාත්‍රාක්‍ෂරයෙන් ගණන් දහසයක් බැගින් කියවේ. මේ ක්‍රමයෙන් සියලූ ගතකුරු යොදා නිමවූ පසු නැවත ක කාරයෙන් පටන්ගෙණ යොදනුලැබෙත්. එසේ යොදන එක එක වාරයෙහි ගතකුරු සමග ඉදිරියෙන් හෝ පස්සෙන් ඒ ඒ වාරය ඇඟවුමට ලින් ඉලක්කම් යොදති, එනම් දෙවෙනි වාරයෙහි අකුරු සමග දෙකේ ඉලක්කමද තුන්වෙනිවාරයෙහි අකුරු සමග තුණේ ඉලක්කමද යනාදි වශයෙනි; ඉලක්කම් නොයොදා ඒ වෙනුවට අ, ආ, ආදි පණකුරු හෝ ව්, ති යනාදී පාළි සංඛ්‍යා පද හෝ යෙදීමද භාවිතාවිය.

## ලින් ඉලක්කම්.

මේවා නක්‍ෂත්‍ර ගණිත පිළිබඳව යොදනු ලැබෙත්; විශේෂයෙන් දවසේ පැටපැය

පිළිබඳ ගණන් කීමට භාවිතාකරණු ලැබෙත්. ඒවා මෙසේය :—

| ඉලක්කම. | නම. | සමාන අරාබි අඞ්කය. |
|---|---|---|
| ෙ | කොම්බුව | 1 |
| න | නයන්න | 2 |
| නා | නායන්න | 3 |
| ජ | ජයන්න | 4 |
| ද | දයන්න | 5 |
| ෲ | ඇක්ම | 6 |
| උ | උයන්න | 7 |
| ර් | රයන්න | 8 |
| නි | නන්නියන්න | 9 |

මේ ඉලක්කම්වලට අල් ලකුණ යෙදූකල එහි වටිනාකම දශවාරයක් වැඩේ. එබැවින් ේ* යනු 10 සි; න් යනු 20යි; නා් යනු 30යි; මේආදි මෙනි. ශූන්‍යය කීමට බින්දුව (0) ද යොදත්. ගණන් දක්වීමට මේ ඉලක්කම්වල යෙදීම අරාබි ඉලක්කම් යොදන පිළිවෙළට වේ : එනම් 84 යනු රජ; 102 යනු ෙ°න හෝ ෙංන; 1547යනු දෙජඋ; 1897 යනු රෙනිඋ.

## කටපයාදි ගණන්.

මේවාද සාමාන්‍යයෙන් නක්‍ෂත්‍ර ගණිත පිළිබඳව යොදන ඉලක්කම් වෙත්. එක ඇගවීමට යොදන (පළමුවෙනි) අක්‍ෂර පන්තියේ ක, ට, ප, ය, යන අකුරු හේතුකොටගෙණ මේ ඉලක්කම්වලට කටපයාදි ගණන් යයි නම් විය. ඒ ඉලක්කම් නම් :—

| ඉලක්කම්. | | | | | සමාන අරාබි අඞ්කය. |
|---|---|---|---|---|---|
| ක | ට | ප | ය | ... | 1 |
| ඛ | ඨ | ඵ | ර | ... | 2 |
| ග | ඩ | බ | ල | ... | 3 |
| ඝ | ඪ | භ | ව | ... | 4 |
| ඞ | ණ | ම | ශ | ... | 5 |
| ච | ත | — | ෂ | ... | 6 |
| ඡ | ථ | — | ස | ... | 7 |
| ජ | ද | — | හ | ... | 8 |
| ඣ | ධ | — | ළ | ... | 9 |
| ඤ | න | — | — | ... | 0 |

* මිට අල්දුම් කොම්බුව ඊ කියනුලැබේ. 11, 12 ආදි ගණන්කිමට යොදන අකුරු කියන්නේ (ෙෙ) කොම්බුවත් [illegible] (ෘන) කොම්බුවත් නයන්න ආදි වශයෙනි.

මේ ලේඛනයේ එක එක අකුරේ හෙවත් ඉලක්කමේ වටිනාකම අරාබි ඉලක්කම්වලින් දක්වන ලදී. මේ ඉලක්කම්වල ගණන ගන්නේ දකුණේ සිට වමටය. මේවායින් අඟවන ගණන් වචනයක සවරූපයෙන් දක්වණ්ට උවමනාකල්හි ඊට වෙන්වශයෙන් යෙදෙන පණකුරු හෝ (ඃ, ං ඈතු එවූ) අල් හතකුරුවල කිසි වටිනාකමක් නැත. එහෙත් ඉලක්කම් දක්වන අකුරු සමග කැමති පණකුරක් (කා, කි, කෙ ආදි වශයෙන්) යොදාගැණීමෙන් ඒවායේ වටිනාකමට බාධා නොපැමිණේ. උදාහරණ :—

විෂ්ණු (4 5) } යනු 54 සි.

ශ්‍රී වර්ෂේ (5 4 6) } යනු 645 සි.

දීපය දීපඃ (8 1 8 1) } යනු 1818 සි.

බධනාති අන්නම සසර්පි (3 0 6 0 5 77 1) } යනු 17750603 සි.

## භූත සංඛ්‍යා.

මෙනම්න්ද ගණන් ඇගවීමට එක් ක්‍රමයක් ඇත්තේය. එය ප්‍රධානකොට නක්‍ෂත්‍ර වෛද්‍යපොත්හිභාවිතාවී තිබේ. පඤ්චමහා භූතවලට ඇතුලත් පෘථිවි ආදි වස්තුවලින් ප්‍රකාශවෙන ගණන් හෙයින් භූතසඞ්ඛ්‍යායයි කියනලදී. මේ ගණන් දක්වන්නේ වචනවලින්ය; එසේ අඟවන ගණන වචනයේ අර්ථ පිළිබඳ යම් කිසි කාරණක් ආශ්‍රය කරගෙණ වේ. උදාහරණ :—බින්දුව ඇගවීමට 'ආකාශ' යන වචනය යෙදේ, මක්නිසාද ආකාශය ශූන්‍ය (හිස්) ස්ථානයක් බැවින; 'චක්‍ෂු' යන ශබ්දයෙන් එක කියනුලැබේ, මක්නිසාද ඒනම්න් ලෝකයේ ප්‍රකටව තිබෙන්නේ එකම වස්තුවක් හෙයින; 'වේද' යන්නෙන් හතර කියත්, මක්නිසාද වේද යන නාමයෙන් වස්තු හතරක් ඇති බැවින; මේආදි වශයෙනි. පෘථිවිය ආදි භූත පසක් ඇති බැවින් භූත යන වචනය පවා ගණනකට (එනම් පහට) නම්විය. යම් වචනයකින් යම් ගණනක් අඟවානම් ඒ වචනයේ අර්ථ ඇතිවෙන (පර්‍යාය) වචනවලින්ද එම ගණන ඇඟවිය හැකිය. සහස්‍රරශ්මි යනු ධම්ප්‍රදීපිකාවේ ප්‍රාරම්භයේ දෙලොස කීමට යොදාතිබේ. එය මෙසේ

පහත ලේඛනයේ 12 කීමට දක්වා තිබෙන වචන අතුරෙන් එකක්වූ සූර්ය්‍යා යන්නට පර්ය්‍යායවූ වචනයකි.

මේ ගණන් දැක්වීමද කටපය ගණන් මෙන් දකුණේ සිට වමටවේ; උදාහරණ :—

සෘෂි නාග කේන්ද්‍ර
7 8 10 } යනු 1087යි.

සින්ධුද්‍රුගාඞ්ග භූ { සින්ධු ද්‍රුග අඞ්ග භූ
4 2 6 1 } යනු 1624යි.

ඛචන්චාඞ්ග මෘගාඞ්ක { ඛ චන්ච අංග මෘගාංක*
0 2 6 1 } යනු 1620යි.

නැකැත් 27 ට භාවිතා කරණ නම් ඒ නැකැත් පිළිවෙළින් 27 දක්වා ගණන් ඇඟවීමට යෙදෙත්. භූත සංඛ්‍යා ක්‍රමයට ඇතුළත් ප්‍රධාන ගණන් කියන පද මෙහි පහත දක්වනු ලැබෙත් :—

0 ට : ශූන්‍ය, ඛ, ගගන, වියත්, ආකාශ, අම්බර, අභ්‍ර, අනන්ත, අන්තරීක්ෂ, ව්‍යෝම.

1 ට : ආදි, ශශින්, ඉන්දු, ක්ෂිති, උර්වරා, ධරා, පිතාමහ, චන්ද්‍ර, ශීතාංශු, රූප, රශ්මි, පෘථිවි, භූ, තනු, සෝම, නායක, වසුධා, ශශාංක, ක්ෂමා, ධරණි.

2 ට : යම, අශ්වින්, රවිචන්ද්‍රෞ, ලෝචන, අක්ෂි, දස්‍ර, යමල, පක්ෂ, නේත්‍ර, බාහු, කරණ, කුටුම්බ, කර, දෘෂ්ටි, චන්ච, දෘග.

3 ට : ත්‍රිකාල, ත්‍රිජගත්, ත්‍රි, ත්‍රිගුණ, ලෝක, ත්‍රිගත, පාවක, වෛශ්වානර, ධන, තපන, හුතාශන, ජ්වලන, අග්නි, වහ්නි, ත්‍රිලෝචන, ත්‍රිනේත්‍ර, රාම, සහෝදර, ශිඛින්, ගුණ.

4 ට : වේද, සමුද්‍ර, සාගර, අබ්ධි, දධි, දිශ්, ජලාශය, කෘත, ජලනිධි, යුග, කෝෂ්ඨ, බන්ධු, උදධි, සින්ධු.

* මෘගාඞ්ක යනු චන්ද්‍රයාට නමකි.

5 ට : ශර, අක්ෂ, ඉන්ද්‍රිය, සායක, වාණ, භූත, ඉෂු, පාණ්ඩව, තත, රත්න, ප්‍රාණ, සුත, පුත්‍ර, විශිඛ, කලම්බ, මාර්ගණ,

6 ට : රස, අරි, අඞ්ග, ඍතු, මාසාර්ධ, රාග, දර්ශන, තර්ක, මත, ශාස්ත්‍ර, රිපෝ, ඛධර.

7 ට : අග, නග, පර්වත, මහීධර, අද්‍රි, මුනි, ඍෂි, අත්‍රි, ස්වර, ඡන්දස්, අශ්ව, ධාතු, කලත්‍ර, ශෛල.

8 ට : වසු, අහි, ගජ, දන්තින්, මංගල, නාග, භූති, ඉභ, සර්ප.

9 ට : ගෝ, නන්ද, රන්ධ්‍ර, ඡිද්‍ර, පවන, අන්තර, ග්‍රහ, අංක, නිධි, ද්වාර.

10 ට : දිශ්, ආශා, කේන්ද්‍ර, රාවණශිර, අවතාර, කර්ම.

11 ට : රුද්‍ර, ඊශ්වර, මහාදේව, අක්ෂෞහිණී, ලාභ.

12 ට : සූර්ය්‍ය, අර්ක, ආදිත්‍ය, භානු, මාස, සහස්‍රාංශු, ව්‍යය.

13 ට : විශ්වම, ත්මඵ, කාමදේව.

14 ට : මනු, ලෝක, ඉන්ද්‍ර.

15 ට : තිථි, පක්ෂ, අහන්.

16 ට : අෂ්ටි, නෘප, භූප, කලා.

17 ට : අත්‍යෂ්ටි.

18 ට : ධෘති.

19 ට : අතිධෘති.

20 ට : නඛ, කෘති.

21 ට : උත්කෘති, ස්වර්ග.

22 ට : ජාති.

23 ට : ධනිෂ්ඨා.

24 ට : ජින.

25 ට : තත්ත්ව.

27 ට : නක්ෂත්‍ර.

32 ට : දන්ත, රද.

33 ට : දේව.

49 ට : තාන.

මෙකී භූත සංඛ්‍යා පද පුරාණ පොත්පත් ගල්ලියවිලි ආදියේ භාවිතාවූ ඒවා වෙති. මේවායේ අනුසාරයෙන් අමුතු වචන යොදගත හැක්කේය. භූත සංඛ්‍යා එළු ලියකියමන්හි යොදනවිට ඉහත පෙණෙන සංස්කෘත පදවලට සමවූ එළු වචන යෙදිය යුතුවේ.

A. M. G.

# සෝඩිය

ස්වස්තිසිද්ධම්

අ ආ ඉ ඊ උ ඌ ඍ ඎ ඏ ඐ එ ඓ ඔ ඖ අං අඃ

ක ඛ ග ඝ ඞ ච ඡ ජ ඣ ඤ ට ඨ ඩ ඪ ණ ත ථ ද ධ න ප ඵ බ භ ම ය ර ල ව ස හ ළ

ඉති සිද්ධිරස්තු

| | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ක | කා | කි | කී | කු | කූ | කෘ | කෲ | කෟ | කෳ | කෙ | කෛ | කො | කෞ | කං | කඃ |
| ඛ | ඛා | ඛි | ඛී | ඛු | ඛූ | ඛෘ | ඛෲ | ඛෟ | ඛෳ | ඛෙ | ඛෛ | ඛො | ඛෞ | ඛං | ඛඃ |
| ග | ගා | ගි | ගී | ගු | ගූ | ගෘ | ගෲ | ගෟ | ගෳ | ගෙ | ගෛ | ගො | ගෞ | ගං | ගඃ |
| ඝ | ඝා | ඝි | ඝී | ඝු | ඝූ | ඝෘ | ඝෲ | ඝෟ | ඝෳ | ඝෙ | ඝෛ | ඝො | ඝෞ | ඝං | ඝඃ |
| ඞ | ඞා | ඞි | ඞී | ඞු | ඞූ | ඞෘ | ඞෲ | ඞෟ | ඞෳ | ඞෙ | ඞෛ | ඞො | ඞෞ | ඞං | ඞඃ |
| ච | චා | චි | චී | චු | චූ | චෘ | චෲ | චෟ | චෳ | චෙ | චෛ | චො | චෞ | චං | චඃ |
| ඡ | ඡා | ඡි | ඡී | ඡු | ඡූ | ඡෘ | ඡෲ | ඡෟ | ඡෳ | ඡෙ | ඡෛ | ඡො | ඡෞ | ඡං | ඡඃ |
| ජ | ජා | ජි | ජී | ජු | ජූ | ජෘ | ජෲ | ජෟ | ජෳ | ජෙ | ජෛ | ජො | ජෞ | ජං | ජඃ |
| ඣ | ඣා | ඣි | ඣී | ඣු | ඣූ | ඣෘ | ඣෲ | ඣෟ | ඣෳ | ඣෙ | ඣෛ | ඣො | ඣෞ | ඣං | ඣඃ |
| ඤ | ඤා | ඤි | ඤී | ඤු | ඤූ | ඤෘ | ඤෲ | ඤෟ | ඤෳ | ඤෙ | ඤෛ | ඤො | ඤෞ | ඤං | ඤඃ |
| ට | ටා | ටි | ටී | ටු | ටූ | ටෘ | ටෲ | ටෟ | ටෳ | ටෙ | ටෛ | ටො | ටෞ | ටං | ටඃ |
| ඨ | ඨා | ඨි | ඨී | ඨු | ඨූ | ඨෘ | ඨෲ | ඨෟ | ඨෳ | ඨෙ | ඨෛ | ඨො | ඨෞ | ඨං | ඨඃ |
| ඩ | ඩා | ඩි | ඩී | ඩු | ඩූ | ඩෘ | ඩෲ | ඩෟ | ඩෳ | ඩෙ | ඩෛ | ඩො | ඩෞ | ඩං | ඩඃ |
| ඪ | ඪා | ඪි | ඪී | ඪු | ඪූ | ඪෘ | ඪෲ | ඪෟ | ඪෳ | ඪෙ | ඪෛ | ඪො | ඪෞ | ඪං | ඪඃ |
| ණ | ණා | ණි | ණී | ණු | ණූ | ණෘ | ණෲ | ණෟ | ණෳ | ණෙ | ණෛ | ණො | ණෞ | ණං | ණඃ |
| ත | තා | ති | තී | තු | තූ | තෘ | තෲ | තෟ | තෳ | තෙ | තෛ | තො | තෞ | තං | තඃ |
| ථ | ථා | ථි | ථී | ථු | ථූ | ථෘ | ථෲ | ථෟ | ථෳ | ථෙ | ථෛ | ථො | ථෞ | ථං | ථඃ |
| ද | දා | දි | දී | දු | දූ | දෘ | දෲ | දෟ | දෳ | දෙ | දෛ | දො | දෞ | දං | දඃ |
| ධ | ධා | ධි | ධී | ධු | ධූ | ධෘ | ධෲ | ධෟ | ධෳ | ධෙ | ධෛ | ධො | ධෞ | ධං | ධඃ |
| න | නා | නි | නී | නු | නූ | නෘ | නෲ | නෟ | නෳ | නෙ | නෛ | නො | නෞ | නං | නඃ |
| ප | පා | පි | පී | පු | පූ | පෘ | පෲ | පෟ | පෳ | පෙ | පෛ | පො | පෞ | පං | පඃ |
| ඵ | ඵා | ඵි | ඵී | ඵු | ඵූ | ඵෘ | ඵෲ | ඵෟ | ඵෳ | ඵෙ | ඵෛ | ඵො | ඵෞ | ඵං | ඵඃ |
| බ | බා | බි | බී | බු | බූ | බෘ | බෲ | බෟ | බෳ | බෙ | බෛ | බො | බෞ | බං | බඃ |
| භ | භා | භි | භී | භු | භූ | භෘ | භෲ | භෟ | භෳ | භෙ | භෛ | භො | භෞ | භං | භඃ |
| ම | මා | මි | මී | මු | මූ | මෘ | මෲ | මෟ | මෳ | මෙ | මෛ | මො | මෞ | මං | මඃ |
| ය | යා | යි | යී | යු | යූ | යෘ | යෲ | යෟ | යෳ | යෙ | යෛ | යො | යෞ | යං | යඃ |
| ර | රා | රි | රී | රු | රූ | රෘ | රෲ | රෟ | රෳ | රෙ | රෛ | රො | රෞ | රං | රඃ |
| ල | ලා | ලි | ලී | ලු | ලූ | ලෘ | ලෲ | ලෟ | ලෳ | ලෙ | ලෛ | ලො | ලෞ | ලං | ලඃ |
| ව | වා | වි | වී | වු | වූ | වෘ | වෲ | වෟ | වෳ | වෙ | වෛ | වො | වෞ | වං | වඃ |
| ශ | ශා | ශි | ශී | ශු | ශූ | ශෘ | ශෲ | ශෟ | ශෳ | ශෙ | ශෛ | ශො | ශෞ | ශං | ශඃ |
| ෂ | ෂා | ෂි | ෂී | ෂු | ෂූ | ෂෘ | ෂෲ | ෂෟ | ෂෳ | ෂෙ | ෂෛ | ෂො | ෂෞ | ෂං | ෂඃ |
| ස | සා | සි | සී | සු | සූ | සෘ | සෲ | සෟ | සෳ | සෙ | සෛ | සො | සෞ | සං | සඃ |
| හ | හා | හි | හී | හු | හූ | හෘ | හෲ | හෟ | හෳ | හෙ | හෛ | හො | හෞ | හං | හඃ |
| ළ | ළා | ළි | ළී | ළු | ළූ | ළෘ | ළෲ | ළෟ | ළෳ | ළෙ | ළෛ | ළො | ළෞ | ළං | ළඃ |

සෝඩිය නිමි